දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට
மாவட்ட செயலகம் – ஹம்பாந்தோட்டை
District Secretariat -Hambantota

"For a prosperous future"

1st Floor, MagamRuhunupura Administrative Complex, Siribopura, Hambantota

මගේ අංකය / My No: DSH/DPS/07/DCC/වාර්තා/2025 } ඔබේ අංකය / You're No }

දිනය / Date } 2025.08.06

හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ
සියලුම සාමාජික මහත්ම මහත්මීන් වෙත,

**හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව - 2025.07.30**

2025.07.30 වන දින පවත්වන ලද හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ ඔබ වෙත එවමි.

02. එම වාර්තාවේ ඔබ ආයතනයට අදාළ කාර්යන් ඉතා කඩිනමින් සාර්ථකව ඉටුකිරීමටත්, ඒ සඳහා අවශ්‍ය වෙනත් ආයතනවල සහයෝගය ලබා ගන්නා ලෙසත් දන්වා සිටින අතර, එම කටයුතු ක්‍රියාත්මක කිරීමේදී ඇති වන ගැටළු නිරාකරණය කිරීම සඳහා අපගේ සහයෝගය අවශ්‍ය අවස්ථා වලදී නොපමාව ඒ පිළිබඳ දන්වා අවශ්‍ය කටයුතු සම්පාදනය කරගන්නා ලෙසත් කාරුණිකව ඉල්ලමි.

03. එසේම, මීළඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කිරීම සඳහා ඉහත වාර්තාවේ ඔබ වෙත පැවරී ඇති වගකීම් ඉටුකිරීම පිළිබඳ ප්‍රගතිය දින 07ක් ඇතුලත හෝ ඊට ප්‍රථම මා වෙත *DCC Hambantota WhatsApp* වෙත හෝ *dpshambantota@gmail .com* වෙබ් ලිපිනයට ලබා දීමට කටයුතු කරන ලෙස ද ඉල්ලමි.

04.තවද, මෙම වාර්තාව *www.hambantota.dist.gov.lk* දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ද ලබා ගත හැකි බව කාරුණිකව දැනුම් දෙමි.

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

පිටපත්:-
01. දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර එම්.කේ.බන්දුල හරිස්චන්ද්‍ර මැතිතුමා - කරු.දැ.ගැ.ස.
02. හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සභාපති හා හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමා - කරු.දැ.ගැ.ස.
03. ජනාධිපති ලේකම් - දැ.ගැ.ස
04. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - දැ.ගැ.ස

District Secretary – 047 2256235
Additional District Secretary (Admin) – 047 2256232
Additional District Secretary (Land) – 047 2256002
Chief Accountant – 047 2256246
Director (Agriculture) – 047 3628890
Director (Planning) – 047 2256234
Assistant District Secretary – 047 2256945
Administrative Officer – 047 2256285
Fax – 047 2256235
email : moha.dist.hambantota@gmail.com
Web site : www.hambantota.dist.gov.lk

CamScanner

# හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම

## 2025.07.30

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති, හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2025.07.30 වන දින පෙ.ව. 9.00ට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

රැස්වීමට සහභාගී වූ සියලුම දේශපාලන නායකයින් මෙන්ම පළාත් පාලන ආයතනවල ගරු නගරාධිපති හා සභාපතිවරුන් හා අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන් දිස්ත්‍රික් ලේකම් තුමා විසින් පිළිගැනීමෙන් අනතුරුව පසුගිය රැස්වීමේදී සාකච්ඡාවූ බොහෝ කරුණු මේ වන විට අවසන් කර ගැනීමට හැකියාවක් ලැබී ඇති බවත් ඇතැම් කරුණු දිස්ත්‍රික් මට්ටමේදී අවශ්‍ය කටයුතු සිදු කර ගෙන ඉදිරි කටයුතු කිරීම සඳහා අමාත්‍යංශ වලට යොමු කර ඇති බවත් එම ගැටළු වලටද වියදම් ලබා ගැනීම තව දුරටත් දිස්ත්‍රික් මට්ටමේදී කල නොහැකි බැවින් එම ගැටළු විසඳා ගැනීම සඳහා සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපතිතුමාගේ මැදිහත්වීම වඩාත් සුදුසු බවද යෝජනා කරමින් ගරු සම සභාපතිතුමා වෙත රැස්වීමේ ඉදිරිකටයුතු කරගෙන යාම සඳහා අවස්ථාව ලබා දෙන ලදි.

අනතුරුව, පොහොසත් රටක් ලස්සන ජීවිතයක් ජනතාවට උරුමකර දීමේ පරම චේතනාවෙන් එකී අරමුණ කරා යාමේදී එක් කරුණක් වන දිස්ත්‍රික්කයට වෙන්කරන ලද මුදල් වලින් උපරිම ප්‍රතිඵල ලගා කරගනිමින් ජාතික අරමුණ සාක්ෂාත් කර ගැනීමට රාජ්‍ය නිලධාරීන් ලෙස අදාල වගකීම් ඉටුකල යුතු බවත් ඒ සඳහා නිලධාරීන් සියළුදෙනා කටයුතු කරන ලෙසත් පැහැදිලි කරමින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට අඛණ්ඩ පැමිණීම අපේක්ෂා කරන බවත් නොවැලැක්විය හැකි හේතුවක් මත පැමිණීමට නොහැකි වේනම්, වගකිවයුතු නිලධාරියෙකු ඒ සඳහා සහභාගි කරවීමට කටයුතු කරන ලෙසත් උපදෙස් දෙන ලදි.

පසුගිය රැස්වීම් වාර්තාව සභා සම්මත කර න්‍යායපත්‍රයට අනුව සභාවේ කටයුතු සිදු කරන ලදි. එහිදී සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01. | 2025.07.11 දිනැති විශේෂ සම්බන්ධීකරණ රැස්වීමේ සාකච්ඡා කරන ලද අධ්‍යාපන සංවර්ධන සැලැස්ම සකස් කිරීමට අදාල ප්‍රගතිය සාකච්ඡා කිරීම. | දිස්ත්‍රික්කයටම පොදු අධ්‍යාපන සංවර්ධන සැලැස්මක් කළාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් හා ගුරු සංගම් එක්ව කළාප මට්ටමින් සකස් කිරීමේ කටයුතු සිදුවෙමින් පවතින බවටත් ඒ සඳහා ප්‍රතිපාදන ලබා දිය හැකි බවටත් කරුණු ඉදිරිපත් විය. | 2025.08.15 දින මේ සම්බන්ධව සාකච්ඡා කිරීමට තීරණය විය. | දිස්ත්‍රික් ලේකම්<br>ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, දකුණු පළාත.<br>කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ, හම්බන්තොට, තංගල්ල සහ වලස්මුල්ල |
| 02. | **2025.06.25 දිනැති සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම.** | | | |
| 2.2 | නවයාලවිල ජලාශය සංවර්ධනය කිරීමේ කෙටි කාලීන පියවර | 2004 වර්ෂයේ සිට මෙකී ජලාශය සංවර්ධනය සඳහා විශාල මුදලක් වැයකර ජලාශයේ සංවර්ධන කටයුතු කලත් ඉදිකිම සඳහා යොදවා නොමැති ඇති අතර ජලාශයේ ගැඹුරට හැරිය හැක්කේ මීටර් 1.5 ක් පමණක් බවත් මේ අවස්ථාවේ ප්‍රතිපාදන ඉල්ලුම් කරනුයේ ජලාශයේ ඉදිකිරීම් සඳහා වන බවටත් කරුණු ඉදිරිපත් විය. | 2026 වර්ෂයේදී ජලාශය සංවර්ධන කටයුතු සඳහා ඊට අදාල ප්‍රතිපාදන වෙන්කර ගැනීමේ කාර්යයන් තුළ පවතින සධ්‍යතාවය අධ්‍යයනය කර පැහැදිලි වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදි. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දකුණ), ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ප්‍රාදේශීය ලේකම්, බෙලිඅත්ත |
| 2.4 | උද්ධකන්දර ග්‍රාම නිලධාරී වසමේ කුඹුවල අසල අනීතික ලෙස කපා බොරළු ප්‍රවාහනය කිරීම. | මෙම ගැටළුවට අදාල රාජ්‍ය ආයතන සමඟ 2025.07.21 දින ස්ථානීය පරීක්ෂාවක් සිදුකර ඇති බවට කරුණු ඉදිරිපත් විය. | සිදුකරන ලද ස්ථානීය පරීක්ෂාවේ සහ සමස්ථය සම්බන්ධව වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදි. | ප්‍රාදේශීය ලේකම්, තිස්සමහරාම.<br>කැණීම් ඉංජිනේරු, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය.<br>දිසා වන නිලධාරී, හම්බන්තොට |

නිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට





CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 2.5 | දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමට නියමිත සුළං සහ සූර්යබලශක්ති ව්‍යාපෘති. | මීට සම්බන්ධව 2025.07.15 වන දින අදාල ආයතන ප්‍රධානීන් එක්ව සාකච්ඡා කරන ලද අතර එහිදී හඳුනාගන්නා ලද සුදුසු ස්ථාන සම්බන්ධව විධිමත් අධ්‍යයනයක් සිදුකර ගන්නා ලද නිගමන අනුව සුදුසුම ස්ථාන හඳුනාගැනීමට තීරණය වී ඇති බවට පැහැදිලි කරන ලදි. | මේ සම්බන්දව ගන්නා ලද තීරණ ඇතුලත් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්,<br>නේවාසික ව්‍යාපාර කළමනාකරු, මහවැලි<br>අදාල ප්‍රාදේශිය ලේකම් වරුන්<br>නාගරික කොමසාරිස්<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය<br>සහකාර අධ්‍යක්ෂ, වනජීවි<br>දිසා වන නිලධාරී |
| 2.6 | දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය තත්ත්වය පැහැදිලි කිරීම. | ජංගම මුරසේවාවක් ලෙස පහත සඳහන් රෝහල් සඳහා ආරක්ෂක මුර සේවාවක් අවශ්‍ය බවට කරුණු ඉදිරිපත් විය,<br>1)ප්‍රාදේශිය රෝහල, නාකුළුගමුව<br>2)ප්‍රාදේශිය රෝහල, ගෝණදෙණිය<br>3)ප්‍රාදේශිය රෝහල, ලුණුගම්වෙහෙර<br>4)ප්‍රා.වෛ.ස.ඒකකය, බඳගිරිය<br>5) ප්‍රා .වෛ.ස.ඒකකය, පලතුඩුව<br>6)ප්‍රා.වෛ.ස.ඒකකය,ගැටමාන්න<br>7)ප්‍රා.වෛ.ස.ඒකකය,විතාරන්දෙණිය | මෙම රෝහල් සඳහා ආරක්ෂක ජංගම මුරසේවාව ලෙස ලබා දෙන ලෙස උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී , තංගල්ල |
| 2.7 | දියබැදිය - අභයපුර මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම. | 2026 වසරේ ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඇස්තමේන්තු සකස් කරමින් පවතින බව දැනුම් දෙන ලදි. | කඩිනමින් ඇස්තමේන්තුව සකස්කර යොමු කරන ලෙස උපදෙස් දෙන ලදි. | ගරු සභාපති, ප්‍රාදේශිය සභාව ලුණුගම්වෙහෙර<br>දිස්ත්‍රික් ඉංජිනේරු, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය.<br>ප්‍රාදේශිය ලේකම්, ලුණුගම්වෙහෙර |
| 2.8 | ගොවි සංවිධාන වලින් ලද කැලෑ කපා හේන් වගා කිරීම සඳහා අවසර ඉල්ලීම. | මෙම ගැටළු වලට අදාලව දිස්ත්‍රික් මට්ටමේදී සාකච්ඡා කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත සහ පරිසර අමාත්‍යංශ ලේකම් වෙත යොමු කර ඇති බවත් අදාල ලිපි සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපතිතුමා වෙත යොමු කිරීමට කටයුතු කර ඇත. | | දිස්ත්‍රික් ලේකම් |
| 2.9 | කොට්ඨාසය තුළ ඇති අනාතුරුදායක ගස් ඉවත් කිරීම, දැව සංස්ථාව මගින් ප්‍රමාද වීම. | | | |
| 2.10 | සංවර්ධන ව්‍යාපෘති සඳහා පස් ලබා ගැනීම. | පළාත් පාලන ආයතන මගින් සංවර්ධන කටයුතු වලදී අවශ්‍ය වන පස් / බොරළු ලබා ගැනීමට අදාල ඉල්ලීම් තිස්සමහරාම ප්‍රාදේශිය සභාව මගින් ඉදිරිපත් කර ඇති බවත් අනෙක් පළාත් පාලන ආයතන මගින් ඉල්ලීම් කර නොමැති බවටත් කරුණු ඉදිරිපත් විය. | පළාත් පාලන ආයතන විසින් පස්වල අවශ්‍යතාවය ප්‍රාදේශිය ලේකම් වෙත ඉල්ලුම් කරන ලෙසත් පස් ලබා ගැනීමට අදාල අවසරපත්‍ර ලබාගැනීමෙ | අතිරේක දිස්ත්‍රික් ලේකම්(ඉඩම්),<br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්<br>කැනීම් ඉංජිනේරු, භූ විද්‍යා හා පතල් කායාංශය |

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති



CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | පස් / බොරළු ලබා ගැනීමට අදාල ස්ථාන තුනක් නිරීක්ෂණය කල අතර එකී ස්ථානවලින් දෙකක කැලෑ ප්‍රදේශය එළිකිරීමට සිදුවන බැවින් එසේ එළිකර පස් ලබා ගැනීමට නොහැකි බවත් පස් ලබාගත් ස්ථානවලින් ගැඹුරට භාරා පස් ලබාගතහැකි වුවද නැවත පස් ලබාගන්නා ලද වලවල් ගොඩකිරීමේ ක්‍රමවේදයක් නොමැති බැවින් වඩාත් සුදුසු ස්ථානයක් ලෙස උද්ධකන්දර ස්ථානය සුදුසු බවට හඳුනාගත් බවත් භූ විද්‍යා හා පතල් කාර්‍යාංශයෙන් හෙක්ටයාර් 1 ක් වෙන්කර දීමට එකඟ වූ බවටත් කරුණු ඉදිරිපත් විය. | ක්‍රමවේදය කඩිනම් කරන ලෙසත් දැනුම් දෙන ලදි.<br>එසේම, 2025.08.21 දින භූ විද්‍යා හා පතල් කාර්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ මූලිකත්වයෙන් පැවැත්වීමට යෝජිත සාකච්ඡාව සඳහා පස් ලබා ගැනීමට අදාල ගැටළු ඉදිරිපත්කර විසඳුම් ලබා ගැනීමට යෝජනා විය.<br>ඒසේම, මීට අදාල සියළුම ආයතන මෙදිනට කැඳවීමට තීරණය විය. | |
| 2.11 | බැහැර කරන ලද ප්ලාස්ටික් එකතුකර එමගින් පවුඩර් වර්ගයක් නිෂ්පාදනය කිරීමේ කර්මාන්තය සඳහා බිම් කොටස් වෙන් කිරීම. | මෙම ව්‍යාපෘතිය සම්බන්ධව ඉදිරිපත්කර ඇති වාර්තාව අනුව ව්‍යාපාරිකයන් විසින් සිදුකර ඇති ඉල්ලීම් හා විසඳුම් ලෙස<br>• මෙම කර්මාන්තයේ යෙදෙන ව්‍යාපාරිකයන් තිදෙනා විසින් බටඅත කර්මාන්තපුරයෙන් පර්චස් 300 ක් ඉල්ලීම් කර ඇති බවත්<br>• සහනදායී ක්‍රමයකට ණය ඉල්ලුම් කර ඇති බවත් හා<br>විධිමත් න්‍යාමනයයක් යටතේ මෙම ව්‍යාපාර පිළිබඳ පසුවිපරම් කළ යුතු බවට පැහැදිලි කරන ලදි.<br>එසේම, මෙම ව්‍යාපෘතිය මගින් පරිසරයට හා ජනතාවට සිදුවන සෘජු හා වක්‍ර අහිතකර බලපෑම හේතුවෙන් දිස්ත්‍රික්කය තුළ පවතින කර්මාන්තපුරයකින් සුදුසු බිම් කොටසක් ලබා දීම අවශ්‍යම දෙයක් වී ඇති බවටත් කරුණු ඉදිරිපත් විය.<br>ඒ අනුව බටඅත කර්මාන්තපුරයේ අක්කර 19 ක ප්‍රමාණයක් හිස්ව පවතින බවත් ඉන් උක්ත කර්මාන්ත කරුවන් තිදෙනා සඳහා පර්චස් 100 බැගින් පර්චස් 300 ක බිම් ප්‍රමාණයක් ලබාදිය හැකි බවත් ඒ සඳහා කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය වෙතින් අනුමැතිය ලබා ගත යුතු බවටත් කරුණු ඉදිරිපත් විය. | මෙකී අමාත්‍යාංශය මගින් අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කරන ලෙස දැනුම් දෙන ලදි. | ප්‍රාදේශිය ලේකම්, අම්බලන්තොට |

බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට.



CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 03. | අනාතුරුව 2025.07.30 දිනට අදාල න්‍යාය පත්‍රයේ කරුණු සාකච්ඡා කරන ලදී. ඒවා පහත පරිදි වේ. | | | |
| 3.1 | සංවර්ධන වැඩසටහන් සම්බන්ධ දැනුවත් කිරීම. | | | |
| 3.1.1 | විමධ්‍යගත අයවැය වැඩසටහන | මෙම වැඩසටහන යටතේ දිස්ත්‍රික්කයට වෙන්වූ රු.මි.80 ට අදාල යෝජනා 49 න් මේ වන විට ව්‍යාපෘති 44 ක් සඳහා ඇස්තමේන්තු සකස් කර ඇති අතර එම ව්‍යාපෘතිවල ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතින අතර දැනට තංගල්ල හා වීරකැටිය කොට්ඨාසවල ව්‍යාපෘති 03 ක වැඩකටයුතු අවසන් කර ඇති බවද දැන්විය.<br>තවද, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මතුවූ ගැටළු හේතුවෙන් අම්බලන්තොට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් සංශෝධන සඳහා ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටු ආවරණ අනුමැතිය යටතේ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා යොමුකල බවත් ඒ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය අවශ්‍ය බවද දැනුම් දෙන ලදී. | දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ ආවරණ අනුමැතිය යටතේ ඉදිරිපත් කල ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා දෙන බවත් සියළු ව්‍යාපෘති නිසි පරිදි අවසන් කිරීමට කටයුතු කරන ලෙසත් උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම්<br><br>අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)<br><br>දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශිය ලේකම්වරුන් |
| 3.1.2 | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන | මෙම වැඩසටහන යටතේ රු.මි. 500 ක් සඳහා අමාත්‍යාංශය වෙත ව්‍යාපෘති යොමු කළත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා මාර්ග සංවර්ධන අධිකාරියට ව්‍යාපෘති 28 ක් සඳහා රු.මි. 189.2 ක ප්‍රතිපාදන ලැබී තිබෙන බවත් ව්‍යාපෘති 25 ක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මඟින් ක්‍රියාත්මක වන බවත් ඉන් ව්‍යාපෘති 20 ක ඇස්තමේන්තු මේ වන විට සකස් කර අවසන් බවත් මේ යටතේ කටුවන , ඕකෙවෙල හා අම්බලන්තොට කොට්ඨාස වල සංවර්ධන ව්‍යාපෘතිවල සංශෝධනය කරගැනීම සඳහා ප්‍රවාහන , මහාමාර්ග, ... වරාය හා ගුවන්සේවා අමාත්‍යාංශය වෙත දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ආවරණ අනුමැතියට යටත්ව යොමු කර ඇති බව දැන්විය. | දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ ආවරණ අනුමැතිය යටතේ ඉදිරිපත් කළ ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා දෙන බවත් සියළු ව්‍යාපෘති නිසි පරිදි අවසන් කිරීමට කටයුතු කරන ලෙසත් උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම්<br><br>අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)<br><br>දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශිය ලේකම්වරුන් |
| 3.1.3 | නිලසෙවන කාර්යාල වල පහසුකම් හා අළුත්වැඩියා කිරීම - 2025 | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 11 ක ව්‍යාපෘති 107 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි.74.84 ක ප්‍රතිපාදන ලබා දී ඇති අතර, ඉන් ව්‍යාපෘති 14ක වැඩ අවසන් බවත්, ඒ සඳහා රු.මි.2.16ක වියදමක් දරා ඇති බවත් දැනුම් දෙන ලදී. | කඩිනමින් ව්‍යාපෘතිවල කටයුතු නිසි පරිදි අවසන් කරන ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම්<br><br>අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)<br><br>අදාල ප්‍රාදේශිය ලේකම්වරුන් |

නිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති



CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| 3.1.4 | දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අනෙකුත් සංවර්ධන යෝජනා - 2025 | ප්‍රජා සවිබලගැන්වීම හා යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය වෙත ග්‍රාම සංවර්ධන සැලසුම් 576 ක් හා ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති 21 ක් අනුමැතියට යොමු කර ඇති බවත් දැනට වීරකැටිය කොට්ඨාසයේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති 1 ක් සඳහා රු.414,100.00 ක ප්‍රතිපාදන අනුමැතිය ලැබී ඇති බවත් දැනුම් දෙන ලදි. | කඩිනමින් ව්‍යාපෘති වල කටයුතු නිසි පරිදි අවසන් කරන ලෙස උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්<br><br>අධ්‍යක්ෂ<br>(ක්‍රම සම්පාදන)<br><br>දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශිය ලේකම්වරුන් |
| 3.1.5 | 2025.06.30 දිනට අනෙකුත් ආයතනවල සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය | දිස්ත්‍රික්කය වෙනුවෙන් රජයේ රේඛීය අමාත්‍යාංශ හරහා ලැබෙන ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් සිදුකරනු ලබන සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය මෙම කමිටුවේදී සාකච්ඡා කිරීම අත්‍යාවශ්‍ය කරුණක් බැවින් 2025.07.11 දින පැවති විශේෂ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත්වූ තොරතුරු මෙම සම්බන්ධීකරණ කමිටුවේ සිට ඉදිරියට සාකච්ඡා කිරීමට උපදෙස් ලැබී ඇති බවත් ඒ අනුව **ඇමුණුම් අංක 01** පරිදි එම තොරතුරු ඉදිරිපත් කරන බවත් එකී තොරතුරුවල සංශෝධන ලබා දීමට කටයුතු කරන ලෙසටත් දැනුම් දෙන ලදි. | එක් එක් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු හරහා සිදුකෙරෙන සංවර්ධන වැඩසටහන් ද්විගණනය නොවන පරිදි ඇතුලත් කරමින් සෑම මසකම අවසානයේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය ලබා දීමට කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්.<br><br>සියළුම ආයතන ප්‍රධානීන් |
| 3.2 | **2025.07.11 දිනැති විශේෂ සම්බන්ධීකරණ රැස්වීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම.** | | | |
| 3.2.1 | හම්බන්තොට මහරෝහල - වකුගඩු රෝග ප්‍රතිකර්ම ඒකකයේ ඉදිකිරීම් නැවත ආරම්භ කිරීම. | මෙම වාට්ටුව ඉදිකිරීම් අවසන් කිරීමට හා උපකරණ මිලදී ගැනීමට පලමු අදියර වශයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ රු.මි. 70 ක් වෙන්කර ඇති බවත් ඊට අදාල ප්‍රසම්පාදන කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යාලයෙන් සිදුකරමින් පවතින බවටත් කරුණු ඉදිරිපත් විය. | මෙම වසර තුළ ව්‍යාපෘතියේ කටයුතු අවසන් කරන ලෙස උපදෙස් දෙන ලදි. | රෝහල් අධ්‍යක්ෂ, මහරෝහල, හම්බන්තොට |
| 3.2.2 | කිරින්ද වරායේ ගොඩගැසී ඇති වැලි ඉවත් කිරීම සඳහා රු.මි. 26 ක් වෙන් කිරීම. | ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන කාර්යාලයෙන් සිදුකරමින් පවතින බවටත් මසක් ඇතුලත අදාල කටයුතු ආරම්භ කලහැකි බවට හා මෙම ක්‍රියාවලියේදී යන්ත්‍රොපකරණ ආයතනය සතුව පවතින බවත් අවශ්‍ය වාහන පෞද්ගලික සැපයුම්කරුවන්ගෙන ලබාගතයුතු බවත් පැහැදිලි කරන ලදි. | කඩිනමින් අදාල කටයුතු සිදුකරන ලෙස උපදෙස් දෙන ලදි. | වරාය කළමනාකරු, කිරින්ද ධීවර වරාය |
| 3.2.3 | දැනට වැඩ ආරම්භකර අතරමග නතර වී ඇති පාලම් ඉදිකිරීම සඳහා රු.මි. 200 ක් වෙන් කිරීම. | වෙන්කර දී ඇති ප්‍රතිපාදන මගින් මූලිකව පල්ලෙකන්ද යාය පාලම, සූරියවැව මළලආර පාලම සහ බෙලිඅත්ත අඹල්මඩුව පාලම යන පාලම් වලින් ප්‍රමුඛතාවය අනුව පල්ලෙකන්ද යාය පාලම, සූරියවැව මළලආර පාලම යන දෙකෙහි ඉදිකිරීම් කටයුතු කඩිනමින් ආරම්භකරන බව දැනුම් දෙන ලදි.<br>ඒසේම, මෙම පාලම් සම්බන්ධව | මෙම වසර සඳහා වෙන් කර ඇති මුදලින් ඵලදායිව සිදුකරන ලෙස උපදෙස් දෙන ලදි. | ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය. |

විමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට



CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | මූලික පරීක්ෂණයක් සිදුකල බවත් ශක්තිමත්භාවය පිළිබඳ ගැටළුවක් නොමැති බවත් වැඩිදුරටත් පැහැදිලි කරන ලදි. | | |
| 3.2 | පළාත් සභා සංවර්ධන වැඩසටහන් සම්බන්ධව දැනුවත් කිරීම. | 2025.07.15 දිනට ප්‍රගතිය ලෙස පහත පරිදි ඉදිරිපත් කරන ලදි.<br>- 2025 වර්ෂයට අදාලව දකුණු පළාත් සංවර්ධන සැලැස්ම තුළ හම්බන්තොට දිස්ත්‍රික්කයේ<br>• පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන **(PSDG)** සහ,<br>• උපමාන පාදක ප්‍රදාන **(CBG)**<br>යටතේ රු.මි.1801.44ක ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති 530 න් ව්‍යාපෘති 28 ක් වැඩ අවසන් කර ඇති බවත් ව්‍යාපෘති 470 ක වැඩ ආරම්භකර ඇති බවත් ව්‍යාපෘති 60ක වැඩ ආරම්භකිරීමට මූලික කටයුතු සූදානම් කර ඇති බවටත් එම ව්‍යාපෘති සඳහා රු. මි.107.98ක වියදමක් දරා ඇති බවත් පැහැදිලි කරන ලදි.<br>එකී මුදල් දකුණු පළාත් සභාවේ අමාත්‍යාංශ 5ට අදාළව ප්‍රාදේශිය කාර්යාල මඟින් ක්‍රියාත්මක කරන බවත් ප්‍රකාශ කරන ලදි.<br>ඒ අනුව පහත පරිදි පළාත් සභා අමාත්‍යාංශ මඟින් උක්ත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදු වන බව පැහැදිලි කරන ලදි. එහි ප්‍රගතිය පහත පරිදි වේ. | ආරම්භ කළ යුතු ව්‍යාපෘති කටයුතු කඩිනමින් ආරම්භ කරන ලෙසත් නියමිත දිනට අවසන් කරන ලෙසත් උපදෙස් දෙන ලදි. | ප්‍රධාන ලේකම්, දකුණු පළාත<br><br>අමාත්‍යාංශ ලේකම්වරුන්, දකුණු පළාත් සභාව<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් සැලසුම් හා මෙහෙයුම් (දකුණු පළාත)<br><br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන් |

| අමාත්‍යාංශය | වෙන් කළ මුදල රු.මි. | ව්‍යාපෘති ගණන | වැඩ අවසන් සංඛ්‍යාව | වියදම රු.මි. |
|---|---|---|---|---|
| ප්‍රධාන අමාත්‍යාංශය | 606.93 | 208 | 07 | 23.83 |
| අධ්‍යාපන අමාත්‍යාංශය | 450.44 | 84 | 08 | 19.86 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 383.51 | 85 | 07 | 27.99 |
| ක්‍රීඩා අමාත්‍යාංශය | 110.17 | 64 | 06 | 6.97 |
| ධීවර අමාත්‍යාංශය | 250.39 | 89 | - | 23.83 |

| | | | | |
|---|---|---|---|---|
| | • **"Clean Sri Lanka"** (අයවැය ප්‍රතිපාදන) වැඩසටහන සඳහා - රු.මි. 25<br>**"සියළුම දරුවන්ට සමාන ඉගනුම් අවස්ථා ලබා දීම"** | මෙම වැඩසටහන යටතේ පාසල්වල ආරක්ෂිත සහ ආකර්ශනීය ඉගෙනුම් පරිසරයක් සහතික කිරීම සඳහා අත්‍යාවශ්‍ය ප්‍රතිසංස්කරණ/ ඉදිකිරීම් සඳහා ව්‍යාපෘති 4 ක් වෙනුවෙන් රු.මි.8 ක් වෙන් කර තංගල්ල, තිස්සමහාරාම, ඕකෙවෙල සහ වලස්මුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මුල්කරගනිමින් | වසර තුල ව්‍යාපෘතිය අවසන් කිරීමට උපදෙස් ලබා දෙන ලදි. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ<br><br>වලස්මුල්ල,තංගල්ල, හම්බන්තොට |



...ල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | වැඩසටහන් ක්‍රියාත්මක බවත්,<br><br>සිසුන්ගේ සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘති 7 ක් වෙනුවෙන් රු.මි.17 ක් වෙන් කර බෙලිඅත්ත, තිස්සමහරාම, වීරකැටිය සහ සූරියවැව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසවල පාසල් මුල්කරගනිමින් වැඩසටහන් ක්‍රියාත්මක බවත් විස්තර කරන ලදි. | | |
| | • ග්‍රාමීය පාලම් වැඩසටහන සඳහා - රු.මි.8.40 | මෙම යටතේ ඔකේවෙල ප්‍රා.ලේ.කොට්ඨාසයේ යටිගල පහලග්‍රාම නිලධාරී වසමේ මාවතගොඩ පාලම සඳහා පළාත් සභා ප්‍රතිපාදන යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇති බවත් දැනට එහි මූලික කටයුතු සිදු කරමින් පවතින බවත් දන්වන ලදී. | වසර තුල ව්‍යාපෘතිය අවසන් කිරීමට උපදෙස් ලබා දෙන ලදී. | දිස්ත්‍රික් ඉංජිනේරු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය<br><br>ප්‍රාදේශීය ලේකම් ඔකේවෙල |
| 3.4 | දිස්ත්‍රික්කය තුළ පවතින ආරක්ෂක තත්ත්වය පිළිබඳ දැනුවත් කිරීම | දිස්ත්‍රික්කය තුළ මේ වන විට මහජන ආරක්ෂක කමිටු 583 ක් පිහිටුවා අවසන් කර ඇති අතර බහුතරයක් නව සාමාජිකයන් ද ඒ අතර පැරණි සාමාජිකයන්ද කමිටු නියෝජනය වන බවත් මෙම කමිටු සාමාජිකයින් දැනුවත්කිරීම සිදුකරන බවත් පැහැදිලි කරන ලදි.<br>ඒසේම, ප්‍රදේශයේ සංරක්ෂනය කළ යුතු දරුවන් සම්බන්ධව හඳුනාගෙන විශේෂ කාර්යයක් සිදුකරන අතර එහිදී<br>1295 - අධි අවධානම් සහිත දරුවන්<br>310 - ඉහල අවධානම් සහිත දරුවන්<br>273 - අවධානම් සහිත දරුවන්<br>204-සාමාන්‍ය අවධානම් සහිත දරුවන්<br>ලෙස හඳුනාගත් දරුවන් පිරිසක් සිටීම තුළ ,<br>ගැහැණු දරුවන්ට කාන්තා පොලිස් නිලධාරීන් දපිරිමි දරුවන්සඳහා පිරිමි පොලිස් නිලධාරීන්ද වශයෙන් සතියට දින 2 බැගින් ඒක් නිලධාරියෙක් සඳහා පවුල් 4 – 5 අතර සංඛ්‍යාවක් වෙන්කර ඒකී දරුවන් අවධානමට ලක්වීමට බලපාන ලද හේතු හඳුනාගනිමින් ඒම අවධානම ඉවත් කිරීම සඳහා කලයුතු දෑ සිදු කිරීමටත් කටයුතු කරමින් පවතින බව හා මෙම අවධානම් සහිත දරුවන් සියළු දෙනාම යහපත් පුරවැසියන් ලෙස සමාජගත කලයුතු බව හා ඒ් සඳහා අධ්‍යාපන, සෞඛ්‍ය ... ආදී අංශ මඟින් සහාය අවශ්‍ය බවත් අවධාරනය කරන ලදි.<br>තවද, මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වන දරුවන් වැඩි වශයෙන් සිටින බවත් මෙකී තත්ත්වය වළක්වා ගැනීමට සක්‍රියව කටයුතු මැදිහත්වන බවත් | මහජන ආරක්ෂක කමිටු සඳහා භාවිතා කරන සාමාජික ඉල්ලුම් පත්‍රය සංශෝධනය විය යුතු බවත් සමහර පරණ සාමාජිකයන්ම පත්වීම තුළ ඔවුන් සම්බධයෙන් අවධානයෙන් කරුණු සොයාබලා කටයුතු කලයුතු බවටත් දැනුම් දෙන ලදි.<br><br>ඒසේම, අවධානම් සහිත දරුවන් යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීම සඳහා අවශ්‍ය සේවාවන් ලබාගැනීමට අදාල සියළු ආයතන සඳහා ලිඛිතව දන්වා ඒකී සේවාවන් ලබා ගන්නා ලෙස උපදෙස් දෙන ලදි. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී , තංගල්ල<br><br>අදාල සියළු ආයතන ප්‍රධානීන් |





ගලේ ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | පරණ ගැටලු මුල් කරගනිමින් මිනිස් ඝාතන දක්වා ප්‍රශ්න දුරදිග ගෙනයාමක් දකින්නට ලැබෙන බව හා ආසන්න වශයෙන් සිදුවූ මිද්දෙණිය ද්විත්ව ඝාතනය සොයා බලා මේ වන විට රතු නිවේදන නිකුතු කර ඇති බවටත් දැනුම් දෙන ලදි. | | |
| 04. | ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටු මඟින් ඉදිරිපත් වී ඇති යෝජනා | | | |
| | ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටුවලින් විසඳුම් ලබා දිය හැකි ගැටළු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීම | ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටුවල සාකච්ඡා කර විසඳුම් ලබා ගත හැකි කරුණු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමේ ප්‍රවනතාවයක් පවතින බවත් ප්‍රාදේශිය වශයෙන් සාකච්ඡා කර පළාත් සභාව, රේඛීය අමාත්‍යාංශ හෝ වෙනත් ආයතන මඟින් විසඳුම් ලබාගැනීමේ හැකියාව පවතින ගැටළු දිස්ත්‍රික් කමිටුව වෙත ඉදිරිපත් වීමෙන් අනවශ්‍ය ප්‍රමාදයක් ඇතිවීම මෙන්ම එමඟින් මෙම කමිටුවේ කාලය කළමනාකරණයට බාධා මතුවන බවටත් අවධානයට ලක්විය. | ප්‍රාදේශිය වශයෙන් සාකච්ඡා කර විසඳුම් ලබා ගැනීමට නොහැකි කරුණු පමණක් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්<br><br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන් |
| 4.1 | ප්‍රාදේශිය ලේකම්, වලස්මුල්ල | | | |
| 4.1.1 | ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය විසින් කර්මාන්තකරුවන් සඳහා නව ට්‍රාන්ස්ෆෝමර් දීමේ දී පුද්ගලයා විසින් ගෙවිය යුතු වීම. | තෙකලා විදුලි සැපයුමක් ඉල්ලුම් කල විට පවතින චක්‍රලේඛ අනුව කටයුතු කරන බවත් පුද්ගලයෙකු වෙනුවෙන් රුපියල් ලක්ෂ 4 ක් පමණක් වෙන් කරන බවත් පැහැදිලි කරන ලදි.කර්මාන්ත කරුවන් දිරි ගැන්වීම සඳහා මෙම චක්‍රලේඛය වෙනස් කිරීම සම්බන්ධව අවධානය යොමු විය යුතු බවත් දන්වන ලදී. | සම්බන්ධිකරණ කමිටු තීරණයක් ලෙස මෙම චක්‍රලේඛය වෙනස් කිරීම සම්බන්ධව සලකා බලන ලෙස විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය දැනුවත් කිරීමට උපදෙස් දෙන ලදී | දිස්ත්‍රික් ලේකම්<br><br>ප්‍රාදේශිය ලේකම්, වලස්මුල්ල<br><br>ප්‍රධාන විදුලි ඉංජිනේරු තංගල්ල |
| 4.1.2 | හ/වලස්මුල්ල ජාතික පාසලේ ගොඩනැගිල්ලක සම්පූර්ණ වහලය දිරාපත්වීම. | පාසලේ 7 ශ්‍රේණිය පවත්වනු ලබන 20*60 ගොඩනැගිල්ලේ සම්පූර්ණ වහලය දිරාපත්වී ඇති බවත් එකී පන්තිය පවත්වාගෙනයාමේ අවධානමක් පවතින බව පැහැදිලි කරන ලදි. | රේඛීය අමාත්‍යාංශය වෙත ඇස්තමේන්තුව ඉදිරිපත් කර ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා යොමු කරන ලෙස උපදෙස් දෙන ලදි. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, වලස්මුල්ල |
| 4.1.3 | හ/වලස්මුල්ල ජාතික පාසලේ පවතින වැසිකිළි, කැසිකිළි පද්ධතිය ප්‍රමාණවත් නොවීම. | පාසලේ ශිෂ්‍යයින් 4000ක් පමණ සිටින බවත්, එහි වැසිකිළි, කැසිකිළි පද්ධතිය ප්‍රමාණවත් නොවන බවටත් කරුණු ඉදිරිපත් විය. | | |
| 4.1.4 | උසස්පෙළ ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන සඳහා ප්‍රතිපාදන ලබා ගැනීම සහ අනිකුත් කලාපවලට හඳුන්වාදීම පිළිබඳ (තංගල්ල කලාපය, හම්බන්තොට | උසස්පෙළ පන්තිවල පවතින ප්‍රතිඵල තත්ත්වය ඉහලනැංවීම සඳහා ප්‍රශ්ණ පත්‍ර සකස් කර සිසුන්ට පෙරහුරු පරික්ෂණ තබා සිසුන් තුළ පුහුණුවක් ලබා දීම තුළින් උසස්පෙළ ප්‍රතිඵල සංවර්ධන ඉහල නැංවීමට කටයුතු කිරීමට අදහස් කරන බවත් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදි.තවද දිස්ත්‍රික්කයේ | මෙම යෝජනාව සඳහා අනුමැතිය ලබා දුන් අතර ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා දකුණු පලාත් ගරු ආණ්ඩුකාර තුමා දැනුවත් කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම්<br><br>ආණ්ඩුකාර ලේකම් දකුණු පළාත<br><br>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, වලස්මුල්ල, තංගල්ල, හම්බන්තොට |

ඩිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට



CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | කලාපය) | අනෙකුත් කලාප සඳහාද මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් බව පෙන්වා දෙන ලදී. | | |
| **4.2** | **ප්‍රාදේශීය ලේකම්, කටුවන** | | | |
| 4.2.1 | හ/කටුවන ජාතික පාසලේ පවතින අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩල හිඟය | මෙම ජාතික පාසලේ ගුරු හිඟයක් පවතින බවත් මෙය දිගුකාලයක් තිස්සේ පවතින බවත් ගුරුවරුන් අනුයුක්ත කිරීමේදී පළාත් සභා ගුරුවරුන් ජාතික පාසල් සඳහා ඇතුලත් කිරීම සම්බන්ධව පවතින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විසින් විධාන මත පදනම්ව කටයුතු කළ යුතු බැවින් විසඳුමකට ලගාවීමට දුෂ්කර වන බව පැහැදිලි කරන ලදී. එහෙත් පළාත් සභාව සතුව ප්‍රමාණවත් ගුරුවරුන් සිටින බැවින් ඔවුන් මගින් ජාතික පාසල් වල පවතින පුරප්පාඩු පිරවිය හැකි බවට කරුණු ඉදිරිපත් කරන ලදී. | අවශ්‍යතාවය අනුව සලකා පළාත් මට්ටමේ ගුරුවරුන් ජාතික පාසල් සඳහා ඇතුලත් කිරීමට පවතින බාධාව ඉවත් කිරීමට කටයුතු කරන ලෙස අදාල අමාත්‍යාංශ දැනුවත් කිරීමට උපදෙස් ලබා දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම්<br><br>දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ<br><br>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, වලස්මුල්ල, |
| 4.2.2 | දංගලකන්ද වසමේ ෆයිනස් වගාව ඉවත් කර මහෝගනී ශාකය වගා කිරීම | දැනට හෙක්ටයාර් 70 ක ප්‍රමාණයක වගාකර ඇති ෆයිනස් වගාව ඉවත් කර එම ප්‍රදේශයේ රබර් වගාව ව්‍යාප්ත කිරීම සඳහා ඉල්ලීම් ලැබී ඇති බවත් පාරිසරික සාධක අනුව එය වඩාත් සුදුසු බවට කරුණු ඉදිරිපත් විය.<br>එහෙත්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රබර් වගාව ප්‍රචලිත කිරීමට අදහස් නොකරන බවත් එම ප්‍රදේශවල මහෝගනී වගාව ඇරඹීම සඳහා දැනටමත් පැල සකස්කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇති බවත් ඊට හේතුව වශයෙන් වැඩි අවධානයක් යොමුව තිබෙන්නේ දැවමය වටිනාකමක් සහිත ශාක වගාවන් සිදුකිරීම බවට කරුණු පැහැදිලි කරන ලදී. | ඉවත්කරන ෆයිනස් වගාව වෙනුවට ජනතාවගේ ඉල්ලීම මත ආර්ථික භෝග වගාවක් ලෙස රබර් වගාව යෙදීම සුදුසු බව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී යෝජනා කළ බව වන සංරක්ෂණ දෙපාර්තමේන්තු වෙත දැනුම් දෙන ලෙසට උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම්, කටුවන<br><br>සහකාර අධ්‍යක්ෂ, දිසාවන |
| **4.3** | **ප්‍රාදේශීය ලේකම්, බෙලිඅත්ත** | | | |
| 4.3.1 | 2022 වර්ෂයේ නිවාස ආධාර වැඩසටහන යටතේ බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෙවන අදියර සඳහා මුදල් ලබා නොදීම | මෙම වර්ෂයේ වසමට එක් නිවසක් යන පදනමින් නිවාස ආධාර වැඩසටහන යටතේ නිවාස 63 ක් ඉදිකිරීම සඳහා 1 වන අදියරේ මුදල් ලබා දී ඇති අතර 2 වන අදියරේ මුදල් ලබා නොදීම හේතුවෙන් එකී නිවාස විවිධ මට්ටම් වලින් ඉදිකිරීම් නතරවී ඇති බවට පැහැදිලි කරන ලදී. | මෙම වැඩසටහන සම්බන්ධව හා මේ වන විට පවතින තත්ත්වය පිළිබඳව පැහැදිලි වාර්තාවක් ලබා දෙන ලෙස දැනුම් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම්, බෙලිඅත්ත |
| **05.** | **දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත්වී ඇති යෝජනා** | | | |
| 5.1 | හ/හුංගම විජයබා ජාතික පාසලේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම | පාසලේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කිරීම සිදුකරන ලදී. | අනුමැතිය ලබා දෙන ලදී. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ<br><br>විදුහල්පති, හ/හුංගම විජයබා ජාතික පාසල |



බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 5.2 | අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොග්ගල්ල බස් නැවතුමේ සිට සූරියවැව කාපට් පාර දක්වා මාර්ගය කාපට් කිරීම | මෙකී මාර්ගයකි.මී. 3 ක පමණ වන ප්‍රධාන මාර්ගය මේ වන විට දැඩි ලෙස අබලන් තත්වයට පත්ව ඇති බවත් මෙකී මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම විශේෂ අවශ්‍යතාවයක් බවත් මෙම යෝජනාව අනුමැතිය සඳහා ඉදිරිපත් කරන බවත් දැනුම් දෙන ලදී. | අනුමැතිය ලබා දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් |
| 06. | සාකච්ඡා කරන ලද වෙනත් කරුණු | | | |
| 6.1 | සූරියවැව ප්‍රාදේශීය සභාව සඳහා උපකරණ ඉල්ලීම | ආයතනයේ කටයුතු කාර්යක්ෂමව කරගැනීමට බැකෝ ලෝඩර්, කම්පැක්ටර්, කැබරථ ආදී යන්ත්‍රෝපකරණ ප්‍රාදේශීය සභාව සතුව නොපවතින බැවින් සභාවේ කටයුතු නිසි පරිදි කරගත නොහැකි බවත් ඒවා ලබා ගැනීමට සහය අවශ්‍ය බවත් ටත් දැනුම් දෙන ලදී. | මේ සම්බන්ධව පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට දැනුම් දෙන ලෙස උපදෙස් දෙන ලදී. | ගරු සභාපති,<br>සූරියවැව ප්‍රාදේශීය සභාව<br><br>දිස්ත්‍රික් ලේකම් |
| 6.2 | මදුනාගල කසළ කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා තෙකලා විදුලි සැපයුමක් ලබා ගැනීම | කසල කළමනාකරන මධ්‍යස්ථානයේ කටයුතු පවත්වාගෙනයාම සඳහා තෙකලා විදුලි සැපයුමක අවශ්‍යතාවය පෙන්වා දෙන ලදී.<br>සූරියවැව හබරත්තවල පාරේ ජයසිරි මහතාගේ කඩය අසල සිට කසල අංගනය දක්වා වන විදුලි මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුවක් 2025.03.26 දින මෙම කමිටුවට ඉදිරිපත් කළ බවත් එම ඇස්තමේන්තුව සඳහා ගෙවීම් කරන්නේ නම් එම විදුලි මාර්ගය ඉදිකර එතැන් සිට කසල අංගනය දක්වා තෙකලා සැපයුමක් සඳහා ඇස්තමෙන්තුවක් ඉදිරිපත් කළ හැකි බව දන්වන ලදී.මෙම ලබා දී ඇති ඇස්තමේන්තුව පළාත් සභා විෂයභාර අමාත්‍යාංශයට යොමු කර ඇති බවට දැනුම් දෙන ලදී. | එම ඉල්ලීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකිරීමට උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම්<br><br>ලේකම්,<br>විදුලිබල හා..<br>අමාත්‍යාංශය,<br>දකුණු පළාත් සභාව<br><br>ප්‍රධාන විදුලි ඉංජිනේරු,<br>හම්බන්තොට |
| 6.3 | හම්බන්තොට ප්‍රාදේශීය සභාවට අයත් ප්‍රදේශයේ පිහිටි වත්කම් පවරා ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීම | ප්‍රාදේශිය සභාවට අයත්විය යුතු දැනටමත් වෙනත් ආයතන භාරයේ පවතින<br>- ක්‍රීඩා පිටි,<br>- ප්‍රජා ශාලා,<br>- සුසාන භූමි,<br>- වෙනත් ඉඩම්, සහ<br>- හම්බන්තොට ප්‍රාදේශිය සභා බල ප්‍රෙද්ශය තුළ මහවැලි අධිකාරිය භාරයේ පවතින වත්කම්<br>ප්‍රාදේශිය සභාවට පවරා දෙන ලෙස ඉල්ලීම් කළත් මේ දක්වා එම කටයුතු ඉටුකර ගැනීමට හැකියාවක් ලැබී නොමැති බවටත් පැහැදිලි කරන ලදී. | මෙම එක් එක් පවරාගැනීම සඳහා අදාල ආයතන වෙන වෙනම ඉල්ලුම් කරන ලෙසත් මේවා පවරා ගැනීම සඳහා අදාල ගාස්තු ගෙවිය යුතු බව දැනුම් දුන් අතර, පළාත් පාලන ආයතන වෙතින් කරනු ලබන මිණුම් ඉල්ලීම් සඳහා ගාස්තු අය නොකරන ලෙස ඉඩම් අමාත්‍යාංශයෙන් ඉල්ලුම් කරන ලෙසද උපදෙස් දෙන ලදී. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්)<br><br>අදාල ආයතන ප්‍රධානීන් |

10

විමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට



CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 6.4 | වැලිගත්ත මහා විද්‍යාලයට අයත් ඉඩම් කොටස හා ගොඩනැගිලි පවරා ගැනීම සම්බන්ධව | දැනට වසා දමා තිබෙන වැලිගත්ත මහා විද්‍යාලයේ ගොඩනැගිලි කොලම් විශ්ව විද්‍යාලයේ කෘෂි තාක්ෂණික පීඨයට ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති බවත් මෙම විද්‍යාලයේ සිසුන් නොමැති බැවින් පැවරීම සඳහා අවශ්‍ය එකඟතාව මේ වන විටත් ලබා දී ඇත බවත් දන්වන ලදී. | මූලික පියවර ලෙස අදාල වත්කම ප්‍රාදේශීය ලේකම් වෙත පැවරිය යුතු බවත් ඉන්පසු ඉදිරි කටයුතු සිදුකරන ලෙසත් දන්වන ලදී. | ප්‍රාදේශීය ලේකම්, තිස්සමහාරාම<br><br>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ |
| 6.5 | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මගින් සිදුවන සේවාවන් පිළිබඳව දැනුවත් කිරීමට අවස්ථාව ලබාගැනීම | මෙම ආයතනය පිළිබඳව හා ඒමගින් විවිධ අංශ යටතේ සිදුකරන සේවා ව්‍යාප්තිය ද ඒයින් ලැබෙන වාසි පිළිබඳවද පැහැදිලි කරන ලදී. ඒ අනුව,<br>- පසුගිය වගා කන්නයන්හි වන්දි ගෙවීම් 2023, 2024, සහ 2025 වර්ෂ වල යල සහ මහ කන්නයන්හි වන්දි ගෙවන ලද ගොවීන් ගණන 8,082 ක් වී ඇත.<br>ඒසේම,<br>- කුරුඳු, රබර්, බඩුන්ගත මඤ්ඤොක්කා, කෙසෙල්, බිම්මල්, සහ පොල් යන වගා සම්බන්ධයෙන් නව රක්ෂණ යොජනා ක්‍රමය<br>- ගවයන් ඒළුවන්, සුරතල් සතුන් සඳහා පශු රක්ෂණ යෝජනා ක්‍රමය<br>- තෙවන පාර්ශවීය රථ වාහන රක්ෂණ යෝජනා ක්‍රමය<br>- සියළුම කෘෂිකාර්මිකයන් සඳහා හා තල්, පොල්, හා කිතුල් කර්මාන්තයේ යෙදෙන්නන් සඳහා සුවසෙත හා හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමය<br>- ධීවරයින් සඳහා "සයුර" හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමය<br>- අනෙකුත් සාමාන්‍ය රක්ෂ යෝජනා ක්‍රම<br>- ගොවි ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම<br>යන සේවාවන් ලබා දෙන බවත්<br>2025 ජනවාරි සිට මැයි 31 වන විට නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා ගොවීන් 6,143 ක් දායකවී ඇති බවත්<br>2025.01.01 දින සිට 2025.07.25 දිනට ගොවීන් 208 ක් ගොවි විශ්‍රාම වැටුප් සඳහා දායකවී ඇති බව හා ඒහි දායක මුදල ලෙස | මෑත කාලයකදී ඉහල සේවාවක් ලබා දෙමින් හොඳ ප්‍රගතියක් ලබා ගැනීමට හැකියාව ලැබී ඇති ආයතනයක් බව දැනුම් දෙන ලදී. | සහකාර අධ්‍යක්ෂ, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය |



දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | රු.2,562,550.00 ක ඉහල ප්‍රගතියක් ලබා ගෙන ඇති බව පැහැදිලි කරන ලදි. | | |
| 6.7 | ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාලය සහ පුහුණු මධ්‍යස්ථානය පවත්වාගෙනයාම සඳහා රජයේ ගොඩනැගිල්ලක් ලබාගැනීම. | දැනට දිස්ත්‍රික් කාර්යාලය මසකට රු. 110,00.00 අධික කුලියකට තංගල්ල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන බවත් මෙකී ආයතනය මගින් පාඨමාලා 99% ක්ම ගාස්තු අයකිරීමකින් තොරව පවත්වාගෙන යන බවත් වර්ග අඩි 6000 කට ආසන්න තංගල්ල ප්‍රදේශයෙන් ගොඩනැගිල්ලක් අවශ්‍ය බවත් දන්වන ලදි. මේ සඳහා දැනටමත් තංගල්ල මුතුමාල විද්‍යාලයේ ඉදිකර ඇති භාවිතා නොකරන ගොඩනැගිල්ල ලබා ගැනීමට හැකියාවක් පවතීනම් එය වඩාත් යෝග්‍ය බවත් දන්වන ලදි.<br>එහෙත්, එම විද්‍යාල ගොඩනැගිල්ල ලබා දීමේ හැකියාවක් නොමැති බව ඔවුන්ට දන්වා විකල්පයක් ඉදිරිපත්කර ඇති බවත් නගරයෙන් තරමක් දුරින් පිහිටි එකී විකල්ප ස්ථාන (නාකුළුගමුව, සිටිනමළුව, උනාකුරුව...) සම්බන්ධයෙන් එකඟතාවයකට පැමිණ නැතැයි දන්වන ලදි. | සුදුසු ස්ථානයක් සොයාගැනීම සම්බන්ධයෙන් සාකච්ඡා කර තීරණ ගැනීම සුදුසු බවට උපදෙස් දෙන ලදි. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ- තංගල්ල<br><br>පුහුණු කිරීමේ නිලධාරී (හම්බන්තොට),<br>ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය |
| 6.8 | බුන්දල රකින වැවේ ජල ධාරිතාවය වැඩිකර ගැනීම සම්බන්ධව | බුන්දල රකින වැවේ ජල මට්ටම තවත් අඩියකින් පමණ එසවීම සිදුකලහොත් අක්කර 37.5 ක් පමණ වගා කළහැකි බවත් එබැවින් මෙකී වැව සුහුරු ව්‍යාපෘතිය යටතේ ඉටුකරදෙන ලෙස ඉල්ලීම් කර ඇති බව දැනුම් දෙන ලදි.<br>එහෙත්, ලෝක බැංකු ණය ආධාර වැඩසටහන යටතේ සුහුරු ව්‍යාපෘතිය මඟින් ඉදිකර ඇති ව්‍යාපෘති බොහොමයක් නිසි ප්‍රමිතියකින් හෝ කිසිදු ඵලදායීතාවයකින් ඉටුකර නොමැති බවත් මෙකී වැඩසටහන යටතේ සිදුකරන ලද ව්‍යාපෘතිය සම්බන්ධව ගැටළු පවතින බවටත් කරුණු ඉදිරිපත් විය.<br>එසේම, රකින වැවේ ජල මට්ටම තවත් අඩියකින් පමණ එසවීම සිදුකලහොත් කුඹුරු ඉඩම් යටවීම සිදුවන බැවින් එය සිදුකල නොහැකි බවට වැඩිදුරටත් සාකච්ඡා විය. | සුහුරු ව්‍යාපෘතිය මගින් ඉදිකර ඇති ව්‍යාපෘති සම්බන්ධයෙන් වෙනම සාකච්ඡාවක් පැවැත්වීමට තීරණය කරණ ලදි. | ව්‍යාපෘති අධ්‍යක්ෂ සුහුරු ව්‍යාපෘතිය |
| 6.9 | බැරගම්විල ආශ්‍රිත උස්සාන ජල ව්‍යාපෘතියක් ආරම්භකිරීම | බැරගම්විල ආශ්‍රිතව ප්‍රමාණවත් ජල ධාරිතාවක් පවතින බවත් එම ජලය සහ පවතින උස්සාන ජල ව්‍යාපෘතිය සුදුසු පරිදි උපයෝගී කරගනිමින් වගා කිරීමට නොහැකිව පවතින මුඩු ඉඩම් අක්කර 100ක ප්‍රමාණයක් කෘෂි අපනයන ගම්මානයක් පිහිටුවීම අපේක්ෂාවෙන් වගාවන් කරගත හැකි | මෙවැනි වියදමක් දැරීම ඵලදායීද යන්න සම්භාව්‍යතා අධ්‍යයනයක් මගින් පරීක්ෂා කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ,<br><br>ප්‍රාදේශීය ලේකම්, අඹලන්තොට<br><br>ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් |



ඉන්දුයා ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | අලුතින් සකස්කරගැනීම සඳහා රු.මි. 50 ක් පමණ වැය විය හැකි බැවින් එය ලබා ගැනීමට අපේක්ෂා කරන බවත් දන්වන ලදි. | | නේවාසික ව්‍යාපෘති කළමනාකරු, රිදියගම ව්‍යාපාරය |
| 6.10 | ඕකෙවෙල කොට්ඨාසයේ පැවති යකඩ පාලම ඉවත් කිරීම | මාර්ගයක් නොමැතිව ඕකෙවෙල කොට්ඨාසයේ ඉදිකර තිබූ යකඩ පාලමෙහි 3/4 ක් පමණ කොටස් කිසියම් පාර්ශවයක් විසින් ගලවා ඉවත් කර ඇති බවට තොරතුරු වාර්තා වී ඇති බවත් මේ වන විටත් පාලමේ ඉතිරි කොටස් මෙම ස්ථානයේ පවතින බවත් 2025.03.26 දින පැවති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී මෙම පාලම දිස්ත්‍රික්කයේ අවශ්‍යතාවයන් වෙනුවෙන් භාවිතා කල හැකි බවට තීරණය කර තිබියදී වෙනත් දිස්ත්‍රික්කයකට ඉවත් කර ගෙන යැම සහ වගකිවයුතු පාර්ශවයන්ගේ අවධානයට ලක් නොවීම බරපතල ගැටළුවක් බවටත් කරුණු ඉදිරිපත් විය. | සියළු පාර්ශව එක්වී මෙම පාලම ඉවත් කිරීම සම්බන්ධව මී ලඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව සඳහා සවිස්තර වාර්තාවක් ලබා දීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදි. | ප්‍රාදේශිය ලේකම්, ඕකෙවෙල<br><br>ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය.<br><br>දිස්ත්‍රික් ඉංජිනේරු, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය. |
| 07 | පසුව ලැබුන ලිපි සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලද කරුණු හා ගනුලැබූ තීරණ | | | |
| 7.1 | ආපදා කළමනාකරණ අංශය ක්‍රියාත්මක කලයුතු ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා ගැනීම. | මෙම වසරේ ක්‍රියාත්මක කලයුතු ව්‍යාපෘති 08ක් සඳහා ප්‍රතිපාදන ලැබී ඇති බවත් එකී ව්‍යාපෘති සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය අවශ්‍ය බව දන්වන ලදි. | මෙකී ව්‍යාපෘති සඳහා අදාල අනුමැතිය ලබා දෙන ලදි. | ආපදා කළමනාකරණ අංශය |
| 7.2 | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලය. | ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ලැබී ඇති ව්‍යාපෘති 10 ක් සඳහා අනුමැතිය ලැබී ඇති බවත් මෙම වසර තුළ ක්‍රියාත්මක කලයුතු තවත් ව්‍යාපෘති යෝජනා 19 ක් ඉදිරිපත් කරමින් එකී ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලීම කරන ලදි. | මෙකී ව්‍යාපෘති නිරීක්ෂණය කර සති දෙකක් ඇතුලත තීරණය ලබා දීමට කටයුතු කරන බවට දැනුම් දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්<br><br>ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් |
| 7.3 | දිස්ත්‍රික්කයේ පාසල් ක්‍රීඩාපිටි සංවර්ධනය | දිස්ත්‍රික්කයේ පාසල් ක්‍රීඩාපිටි සංවර්ධනය සඳහා රු.මි. 10 ක ප්‍රතිපාදන ලැබී ඇති බවත් කඩිනමින් දිස්ත්‍රික් සම්බන්ධීකරන කමිටු අනුමැතිය සහිතව මෙකී ව්‍යාපෘති යොමු කලයුතු බැවින් අද දින සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කිරීම සඳහා කළාප අධ්‍යක්ෂකවරු මඟින් යෝජනා ලබා ගත් බවත් එකී යෝජනා අතරින් වඩාත් සුදුසුම යෝජනා හඳුනා ගැනීම අවශ්‍ය බව දන්වමින් එම ලේඛන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලදි.මෙම යොජනා අතරින් මිද්දෙනිය මහා විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය සඳහා රු.මි.3.4 ක් ද ,තිස්සමහාරාම යෝධ කණ්ඩිය ශ්‍රී දේවානන්ද විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය සඳහා රු.මි.3.3 ක් ද,තංගල්ල කුඩාවැල්ල ජයවික්‍රම මහා විද්‍යාලයේ ක්‍රීඩා පිටිය | ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා යෝජනා කඩිනමින් යොමු කරන ලෙසත් ඇස්තමේන්තු සකස් කර මූලික කටයුතු සූදානම් කර ගන්නා ලෙසත් උපදෙස් ලබා දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්<br><br>දිස්ත්‍රික් ඉංජිනේරු<br><br>අදාල ප්‍රාදේශිය ලේකම්වරුන්<br><br>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් |



කපිල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | සංවර්ධනය සඳහා රු.මි.3.3 ක් ද, වෙන් කිරීම සුදුසු බවට යෝජනා විය. | | |
| 7.4 | දිස්ත්‍රික්කයේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පවතින ගැටලු | පාසල්වල ඩෙස් පුටු සකස් කර ගැනීම සඳහා දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් රු.මි.9 ක ප්‍රමාණයක් වෙන්කර දී තිබියදීත්<br>- ඇතැම් පාසල් වලින් ඩෙස් පුටු සකස් කර දීම සඳහා මුදල් එකතුකිරීම,<br>- පාසල්වල මේ දිනවල පැවැත්වෙන වාර විභාග සඳහා ඇතැම් පාසල් සිසුන්ගෙන් මුදල් අයකිරීම් සිදුකර ඇති බව,<br>- ශිෂ්‍ය නායක උත්සව සඳහා මුදල් එකතු කිරීම්<br>ආදි මුදල් එකතු කිරීම් සිදුවන බවට වාර්තා වීම් සිදුවන බව සාකච්ඡාවට ලක්විය.<br>එසේම, විදුහල්පති ශ්‍රේණිධාරී ගුරුවරුන් පුරප්පාඩු පවතින පාසල් සඳහා අනුයුක්ත නොකර සිටීම වැනි බරපතල කාරණා අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාලව සිදුවන බවත් මේ සඳහා බලධාරීන්ගේ අවධානය ඉතා අඩුමට්ටමක පවතින බවටත් කරුණු ඉදිරිපත් විය.<br>තවද,<br>- අනධ්‍යයන කාර්යමණ්ඩලය නිසිපරිදි අනුයුක්ත නොකිරීම,<br>- මුරකරුවන් අවිධිමත් ලෙස ස්ථාන මාරු කිරීම<br>- තංගල්ල කලාප කාර්යාලය තුළ වායු සමීකරණ පද්ධතිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් නිලධාරීන් දැඩි අපිරුතාවයකට පත්වීම<br>යන ගැටළු වාර්තා වී ඇති බවත් දන්වන ලදී. | පාසල් පද්ධතියේ උන්නතිය වෙනුවෙන් මෙම කමිටුවේදී ගනු ලබන තීරණ අදාල බලධාරීන් විසින් ක්‍රියාවට නැංවිය යුතු බවත් අනිතික මුදල් එකතුකිරීම් නතරකල යුතු බවත් විදුහල්පති වරුන්, අනධ්‍යයන සේවකයන් අනුයුක්ත කිරීමේදී අවශ්‍යතාවය පදනම් කරගෙන සුදුසු පරිදි කටයුතු කළ යුතු බවටත් උපදෙස් දෙන ලදී.<br><br>වායුසමීකරණ යන්ත්‍ර අදාල පරිදි සවිකිරීම සඳහා කඩිනමින් ඇස්තමේන්තුවක් ඉදිරිපත්කර මුදල් ලබා ගන්නා ලෙසට උපදෙස් ලබා දෙන ලදී. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - හම්බන්තොට, තංගල්ල සහ වලස්මුල්ල<br><br>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තංගල්ල |
| 7.5 | පරිපාලන සංකීර්ණය ඉදිරිපිට ප්‍රධාන මාර්ගයේ විදුලි පහන් සවි කිරීම සම්බන්ධව | නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා මහනගර සභාවේ එකඟතාවය ලැබේ නම් මෙම කොටස ගාස්තු අය කිරීමකින් තොරව සිදු කර දිය හැකි බව මාර්ග සංවර්ධන අධිකාරිය ප්‍රකාශ කරන ලදී. එහෙත් මහනගර සභාව සතුව ඒ සඳහා ප්‍රතිපාදන නොමැති බැවින්එවැනි එකඟතාවයක් ලබාදිය නොහැකි බවත් දන්වන ලදී.තවද නාගරික සීමා තුල පළාත් පාලන ආයතන විසින් පවත්වාගෙන යනු ලබන වීදි පහන් සඳහා ගාස්තු අය නොකරන බවට තොරතුරු ඉදිරිපත් වූ බැවින් මෙම විදුලි පද්ධතියද නගර සභාව වෙත පැවරීම | කමිටුවේ තීරණයක් මත මෙම විදුලි පහන් පද්ධතිය මහනගර සභාව වෙත පවරා දෙන ලෙසත් විදුලි බිල ගෙවා දැමීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා වෙතින් ඉල්ලීම් කිරීමටත් තීරණය කරන ලදී. | දිස්ත්‍රික් ලේකම්<br><br>ආණ්ඩුකාර ලේකම් දකුණු පළාත්<br><br>ප්‍රධාන ඉංජිනේරු මාර්ග සංවර්ධන අධිකාරිය<br><br>නාගරික කොමසාරිස් හම්බන්තොට ම.න.ස |



විමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

CS CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | සුදුසු බවට යෝජනා ඉදිරිපත් විය. | | |
| 7.6 | ඉන්ධන පිරවුම්හල අසලට නව මාර්ග මධ්‍යය විවරයක් ලබා ගැනීම | මෙම ඉන්ධන පිරවුම්හලට සමීපව ජල සම්පාදන මණ්ඩලයට අයත් ජල ටැංකිය වෙත ප්‍රවේශ වීම සඳහා මාර්ග මධ්‍යයෙන් පිවිසුමක් පවතින බැවින් ඊට ආසන්නව තවත් පිවිසුමක් ලබා දීමට මාර්ග සංවර්ධන අධිකාරියේ නිර්ණායක අනුව කල නොහැකි බැවින් ජල ටැංකි ආසන්නයේ පිවිසුම වසා දැමීමට එකඟතාවයක් පවතින්නේ නම් ඉන්ධන පිරම්හල අසලින් මාර්ග මධ්‍යය විවරකර දිය හැකි බවට තොරතුරු ඉදිරිපත් විය. ජල සම්පාදන මණ්ඩලයට අයත් වාහන ද ඉන්ධන පිරවුම්හලට ආසන්නව යෝජිත නව මර්ග මධ්‍යය හරහා ගමන් කළ හැකි බැවින් දැනට පවතින මාර්ග මධ්‍යය පිවිසුම වසා දැමීම සම්බන්ධව ගැටළුවක් නොමැති බවට කරුණු ඉදිරිපත් විය. | එම එකඟතා පරිදි අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම්<br><br>ප්‍රධාන ඉංජිනේරු මාර්ග සංවර්ධන අධිකාරිය<br><br>ප්‍රාදේශීය කළමනාකරු ජල සම්පාදන |

යෝජිත මීලඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා අදාල සියළු නිලධාරීන් හොඳ ප්‍රගතියක් ද කැටුව පැමිණෙන ලෙසත් අද දින දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් පැමිණ සිටි සියලු දෙනාටම ස්තුතිය පල කිරීමෙන් අනතුරුව පස්වරු 2.15 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය

බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

2025 අගෝස්තු මස ........................
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.